2019 වසර තුළ ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ දිවි අහිමි කරගැනීම් ගණන 3,135 ක් වේ යැයි පොලිස් වාර්තා පවසයි. එනම් සාමාන්‍යය වශයෙන් දිනකට දිවි අහිමි කරගැනීම් 8.5 ක් සිදුවී ඇත. දිවි අහිමි කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යෑමේ හැකියාවක් පවත්නා අතර, මාධ්‍ය දිවි නසා ගැනීම් හෝ දිවි නසා ගැනීම් සම්බන්ධ වන පුවත් වාර්තා කිරීමේදී ප්‍රවේසම්කාරී සහ ආචාරධර්මානුකූල ප්‍රවේශයක් ගැනීම අත්‍යාවශ්‍ය වන්නේ එහෙයිනි.

ඊට උදාහරණ ලෙසින් පහත පුවත් වාර්තාවන් දැක්විය හැක. මෙහිදී පුවතට ප්‍රස්තුත වී ඇත්තේ දිවි අහිමි කරගැනීම නොවූවත්, පුවතෙහි එන සිදුවීමට කරුණු වූ දිවි අහිමි කරගැනීමද අවධානයට ලක් වන ලෙසින් පුවත් වාර්තාව තුළ දැක්වී තිබේ. එනිසා, මෙවැනි පුවත් සමගින්ද උපකාරක අංක සඳහන් කිරීම යෝග්‍ය නොවන්නේදැයි අප විමසිය යුතුවේ. හදිසි උපකාරක අංක සඳහන් කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් අයෙකුගේ දිවි ගලවා ගැනීමට අවකාශයක් ලැබෙනු ඇත.

මූලාශ්‍ර:
https://www.police.lk/index.php/item/138
https://accountablejournalism.org/ethics-codes/australia-standards-of-practice-suicide-reporting
https://apps.who.int/iris/bitstream/handle/10665/258814/WHO-MSD-MER-17.5-eng.pdf;jsessionid=D14833A4878E3B3D96D0721858FB5F4E?sequence=1

හදිසි උපකාරක අංක:
*1333-CCCline
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ -0112696666
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926

#MediaEthicsSL #lka #SinhalaPress #Lankadeepa #Divaina #Aruna